# ප්‍රායෝගික ගොවි පුහුණුවෙන් ප්‍රයෝජන ලබන දක්‍ෂ තරුණයා

## "බෝම්බුවල හැචරීස්"

ග්‍රාමීය තරුණ තරුණියන්ට විද්‍යාත්මක ගොවි පුහුණුවක් ලබාදීම සඳහා අප දිවයිනේ ප්‍රායෝගික ගොවි පාසැල් මාලාවක් පිහිටුවා තිබෙයි. තමන් සතු හෝ තම දෙමව්පියන් සතු ගොඩමඩ ඉඩම් යම් ප්‍රමාණයක් ඇති නොඑසේ නම් පුහුණුවෙන් පසු ගොවිතැනට ඉඩම් කැබැල්ලක් ලබා ගැනීමට බලාපොරොත්තු මෙම තරුණ තරුණියන් උදෙසා පිරිමි පාසැල් 14 ක් හා ගැහැණු ගොවි පාසැල් 4 ක්ද, දනට දිවයිනේ ඇත. කිලිනොච්චිය, වව්නියාව, කරදියන් අරු, අනුරාධපුරය, මහඉලුප්පල්ලම, පැල්වැහැර, වාරියපොල, බිබිලේ, වාගොල්ල, හොරණ, අඹේපුස්ස, ලබුදූව, මාපලාන හා කරපිංච යන ස්ථානන්හී පිහිටුවා ඇති පිරිමි ගොවි පාසැල් 14 හි සහ වල්පිට, ලබුදූව, තින්නවේලි, බණ්ඩාරවෙල හා බටන්ගල නමැති තන්හී ඇති ගැහැණු ගොවි පාසැල් 5 හේද වර්ෂයක ප්‍රායෝගික ගොවි පුහුණුවක් එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට දෙනු ලැබේ.




සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවම නේවාසිකව සිටින එම අවුරුද්ද තුළදී ඔවුන් සියළු දෙනහට සියුම් ප්‍රායෝගික ගොවිකම් අධ්‍යාපනයක් විද්‍යාත්මකව සපයනු ලැබෙයි. පුහුණුවෙන් පසු, ජනප්‍රිය කෘෂිකාර්මික කටයුතුවල යෙදීමට හැකිවන පරිදි හැඩගස්වන මෙම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සංඛ්‍යාව 675 පමණි. එයින් 525 ට අධික ගණනක් පිරිමි සිසුන් හා 150 ට වැඩි සංඛ්‍යාවක් ගැහැණු සිසුන්ද සාමාන්‍ය වර්ෂයකදී එම ගොවි පාසැල් 19 යේ පුහුණුව ලබති. එහෙත් එම විශාල සංඛ්‍යාවෙන් ප්‍රයෝජන ගන්නා ප්‍රමාණය කිසිසේත් සතුටු දයකයයි කිව නොහැක.

කරුණු එසේ වූ මෙම අවදියේ, තමන්ගේ ගොවි පුහුණුවෙන් ප්‍රයෝජන ලබන උද්යෝගිමත් තරුණයෙකු ගැන කළුතර දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි හෙක්ටර් වික්‍රමසිංහ මහතා අපට දන්වා තිබුණෙන්, මැතදී අප එම තරුණයා

හමුවී ඔහුගේ ගොවි කටයුත්ත බැලීමට ගියේ විශාල බලාපොරොත්තුවක් ඇතිවය. අපගේ බලාපොරොත්තුව නිෂ්ප්‍රභා නොවීය. අපට හමුවූ එම දක්ෂ තරුණයා හා ඔහුගේ ගොවි ව්‍යාපාරයෙන් අප බෙහෙවින් සතුටට පත් වුනෙමු. පී. ඩී. විපුලසේන නමැති එම තරුණයා හා '' බෝම්බුවල හැචරීස් '' යන ඔහුගේ කුකුළු වෙළඳ ව්‍යාපාරයේ තොරතුරු මෙසේය :


ගොවිකම් ව්‍යාප්ති ආධාර අංශයේ ඡායාරූප ශිල්පී ටී. බී. මහින්දරත්න මහතා හා සමඟ අප කළුතර බලා ගියේ වැහිබර දිනයකදීය. කළුතර දුම්රිය ස්ථානයේ දී අප හමුවූ පළාතේ ගොවිකම් ව්‍යාප්ති නිලධාරි ඩබ්ලිව්. ඇස්. පී. නානායක්කාර මහතා අප කැඳවා ගාලු පාරේ සැතපුම් බාගයක් පමණ ගියේය. දකුණු කළුතර, ගාලු පාරේ, අංක 922 දරණ ගොඩනැගිල්ලෙහි පිහිටුවා ඇති '' බෝම්බුවල හැචරීස් '' වෙළඳ ව්‍යාපාරය හා එය හිමි විපුලසේන මහතාද අප පළමුව දුටුවේ එලෙසය. ව්‍යාපාරය හා ව්‍යාපාරිකයා කෙරෙහිද අප බැලූ බැල්මෙන් සතුටු වුනෙමු. යන්ත්‍රානුසාරයෙන් බිත්තර රක්කවා පැටවුන් දිනක් වයසේ සිට තෙමස් වියස් දක්වා කාලයන් අතරතුරදී උන් අලෙවිය කරන මෙම කුකුළ් ව්‍යාපාරය පැටවුන් වෙළහෙළඳාමට පමණක් සීමාකර නැත. නොයෙකුත් වයස් ප්‍රමාණයන්ගේ පැටවුන්ට අමතරව එහි කුකුළ් කෑම, කුකුළන් ඇතිකිරීමේ උපකරණ සහ බෙත් හේත් ආදියද අලෙවි කරනු ලැබෙයි. කුකුළන් ඇතිකිරීමේ නොයෙකුත් කරුණු පැහැදිළි කෙරෙන විස්තර පත්‍රිකාවන් මෙහිදී නොමිලේ ලබා ගත හැකි අතර විපුලසේන මහතා නො මිලේ හා නොමසුරුව සපයන අනෙක් දේ නම් කුකුළන් ඇති කිරීම පිළිබඳව විද්‍යාත්මක විස්තරයන්ය.

කළුතර නගරයේ විපුලසේන මහතා විසින් පිහිටුවා ඇති ''බෝම්බුවල හැචරීස් '' වෙළඳ ස්ථානයයෙන් දිනක් වයසැති පැටවුන් එකකු සත 60 ට, දින පහේ සිට සතිය දක්වා පැටවුන් ශත 70 බැගින්, සති දෙකේ උන් ශත 80 ට, සුමාන තුනේ උන් රුපියල බැගින්ද මිළදී ගැනීමට පිළිවන. ඒ අතර මාස 1½ රු. 1.25, මාස දෙක රු. 2.50 හා මාස තුන පැටවුන් රු. 4 යන ප්‍රමාණයන්ට අලෙවි කරනු ලැබේ. විපුලසේන මහතා මීට වැඩි වයස් සතුන් අලෙවි කිරීම සඳහා සාමාන්‍ය වශයෙන් තබාගන්නේ නැත. බිත්තර දැමීමට ආසන්න පක්ෂීන් සඳහා ඔහුගෙන් ඉල්ලුම් ඇති නමුත් එතෙක් උන් තබා ගැනීම ආහාර විශාල ප්‍රමාණයක් වැය වන බැවින් ආර්ථික කටයුත්තක් නොවන්නේය.

කුකුළ් ආහාර වශයෙන් මෙම ස්ථානයෙහි කුඩා පැටවුන්ගේ ආහාර මිශ්‍රණයන්, වැඩෙන සතුන්ගේ ආහාර මිශ්‍රණයන් හා බිත්තර දමන කිකිළියන්ගේ මිශ්‍රණයන් ලෙස වෙන් වෙන්ව ලබා ගත හැකිය. මේවාද නොයෙකුත් '' කුකුළ් ආහාර සම්පාදක ආයතනයන්ගේ '' නිෂ්පාදනයන් වශයෙන් ලබා ගත හැකි බැවින් කුකුළු ආහාර මිළදී ගන්නා අයට තෝරාගත හැකි වර්ග රාශියක් එහි තිබෙයි. ඒ අතර එහිදී එම ආහාර වර්ගයන් රාත්තලක් හෝ ඉන් අඩක් සිට හොන්ඩර ගණනාවක් දක්වාද මිළදී ගැනීමට පහසුකම් ඇති හෙයින් මෙහි ඕනෑම තරාතිර මේ අයෙකුට ගණුදෙනු කිරීමට පිළිවන. එමෙන්ම නගරයේ සිට සැතපුම්



බිත්තර රක්කවන විශාල යන්ත්‍රය හා එයින් පිටවූ පැටවුන්



පහක් ඇතුළත ස්ථානයන්ට කුකුළ් ආහාර ප්‍රවාහනය විපුලසේන මහතා භාර ගනී.

කුකුළන් ඇති කිරීමේ උපකරණ වශයෙන් එහි කෑම භාජන, වතුර භාජන, කූඩු හා ගෙවල් සෑදීමේ උපකරණ යනාදිය ගණනාවක්ම ලබා ගත හැකිය.


ඒ අතර එහි බේත් හේත් වර්ග මාලාවක්ම තිබෙයි. පැටව් වැඩීමට බේත් වර්ග, කොක්සිඩියෝසිස් හා කුකුළ් සෙම්ප්‍රතිශ්‍යාවට බෙහෙත්, පණු බේත් වර්ග, කොක්සිඩියෝසිස්, කොලරා මර්දන හා විටමින් අඩංගු තනිකර බෙහෙත් මිශ්‍රණ, බිත්තර දැමීමට, බිත්තර වැඩිවීමට පමණක් නොව සාමාන්‍ය සෞඛ්‍යයට වුවමනා බෙහෙත් පවා '' බෝම්බුවල හැවරීස් '' වලින් ලබා ගතහැකිය.

විපුලසේන මහතා අලෙවි කරන කුකුළ් පැටවුන් ගැන තවද යමක් සඳහන් කළ යුතුව තිබෙයි. උන් විකුණන තෙක් ඒ ඒ සතුන්ට සනීපාරක්ෂක කටයුතු නිසිසේ ඉටු කිරීම ඔහු අතපසු නොකරන කාර්‍ය්‍යයකි. '' බෝම්බුවල හැවරීස් '' වල විකිණීමට ඇති කුකුළු පැටවුන් මාසයක් වයස්වූ විට උන්ට පළමු වතාවට පණු බේත් දෙනු ලැබේ. මාස එක හමාරක් වීමට පෙර කුකුළ් වසූරියට බෙහෙත් එන්නත් කිරීම සිදුවන්නෙකි. මාස තුනේදී නැවත වරක් පැටවුන්ට පණු බේත් දී, ඉන්පසුව රණිකට් නොහොත් වසංගත රෝගයට බෙහෙත් විදීම ඉටුවන්නේය. ඒ අතර ඔහු රක්කවීම සඳහා බිත්තර ලබා ගන්නේ පුල්ලෝරම් රෝගයෙන් තොර කිකිළියන් ගේ බිත්තර නිසා විපුලසේන මහතා විසින් විකිණීමට ලබා ඇති සෑම පැටවාම නිරෝගී සතෙකු වේ.

''බෝම්බුවල හැචරීස්''හි ඇති සුවිශාල බිත්තර රක්කවන යන්ත්‍රය, බිත්තර 3,000 ක් වරක දැමිය හැකි විදුලි බල වේගයෙන් ක්‍රියා කරවන උපකරණයකි. රුපියල් 2,200ක් මිළ වන මෙම යන්ත්‍රය විපුලසේන මහතා විසින් මිළදී ගෙන ඇත්තේ කොටස් දෙකකින් මුදල් ගෙවා ය. මෙහි වරෙක බිත්තර 300 බැගින් දැමීමට පිළිවන. එනිසා, දළ වශයෙන් විපුලසේන මහතාහට දිනකදී විකිණීම සඳහා පැටවුන් සියයක් ලැබෙයි. ඒ අතර රක්කවීම සඳහා තබන බිත්තර වලින් සියයට 70 ට අධික ප්‍රමාණයක් පැටවුන් මතුවන බව ඔහු පැවසීය. රක්කවීම සඳහා බිත්තර වැඩි වශයෙන් ඔහු ලබා ගන්නේ ඔහුගේම කුකුල් කොටුවෙන්ය. ඔහු සුළු වශයෙන් පිටින් ලබා ගන්නා රක්කවීමේ බිත්තර විශ්වාසදායක ස්ථාන වලින් පමණක් ලබා ගනී. නිෂ්පාදකයින්ගේ උපදෙස් අනුව බිත්තර රක්කවන යන්ත්‍රයේ විෂ බීජාදිය නැසීම විපුලසේන මහතා අත පසු නොකරන කාර්‍යයකි.

'' බෝම්බුවල හැචරීස් '' වෙළඳ ව්‍යාපාරය පිහිටුවීමේ විස්තර විපුලසේන මහතා අපට කීවේ මෙසේය :

'' 1959–60 ශාස්ත්‍රාලයීය වර්ෂයේදී හොරණ ප්‍රායෝගික ගොවි පාසැලේහි පුහුණුව ලබා , 1960 මාර්තු මාසයේදී මා පාසැලෙන් පිටවීමි. පාසැලනේ පිට වූ නොබෝ දිනකින් මා නැවත කුකුළු පාලනයට පා තැබුවෙමි. එසේ සඳහන් කරන්නේ මා ගොවි පාසැලට යෑමට පෙර ද කුකුළන් ඇති කිරීම කළ බැවිණි. දෙවන අවස්ථාවේ ආරම්භ කළ මගේ ව්‍යාපාරය දිනක් වයස් වයිට්ලෙගෝන් පැටවුන් 30 න් පටන්ගත් එකකි. එය



දෙමස් වයස් පැටව් හා කුකුල් බෙත්,
උපකරණ ආදිය



ක්‍රමයෙන් පුළුල්වී 1962 දෙසැම්බර් වන විට බිත්තර දමන කිකිළියන් 75 දක්වා වැඩි විය. එකල මට අඩු වශයෙන් දිනකට බිත්තර 60 ක් ලැබුණි. මෙවැනි ප්‍රමාණයේ කුකුළු ව්‍යාපාරයකට අවශ්‍ය නිවෙස් හා අනෙකුත් දෑ මවිසින් නිසිසේ සැපයී තිබුණි. එකල මා ලැබූ මාසික ආදායම රුපියල් සියයක් පමණ විය.

මාගේ ආදායම වැඩි කර ගැනීමට හා මා ලැබූ පුහුණුවෙන් නිසි ප්‍රයෝජන ලබා ගැනීමට ද වුවමනා කළ මට, මගේ කුකුළු ව්‍යාපාරය වැඩි දියුණු කිරීමේ මාර්ගයන් ගැන සිත ගියෙමි. මෙම කාල සීමාවේදී කුකුළ් පාලන කටයුතු සඳහා අවශ්‍ය සියළු දේ ලබා ගැනීමට විශ්වාසදයක ආයතනයක් කළුතර නගරයේ තිබුණේ නැත. '' බෝම්බුවල හැචරීස් '' මගේ ඒ සිතුවිලිවල ප්‍රතිඵලයකි.

මෙවැනි ව්‍යාපාරයක් පිහිටුවීම සඳහා අවශ්‍ය මූලික ධනය මා සතු නොවීම මට විශාල සිත් තැවුලක්වුවද, මා එයින් පසුබට නොවීමි. '' සිත ඇත්නම් පත කුඩාද '' යන ප්‍රස්තාව පිරුළ මා සිහියට ආවේ එවිටයි. කෙසේ හෝ අවශ්‍ය මුදල් ලබා ගැනීමට සිත්වූ මම මගේ දෙමව්පියන්ගෙන් මුදලින් හා බසින්ද ආධාර ලදිමි. ඒ අනුව 1962.12.27 වන දින කුකුළ් කෑම, බෙත් හේත්, වතුර හා ආහාර භාජන විකිණීමට සපයා '' බෝම්බුවල හැචරීස් '' විවෘත්ත විය. ඒ අතර 1963.1.15 වන දින මවිසින් ඉල්ලුම් කර තුබූ රක්කවීමේ යන්ත්‍රයද ලැබුණෙන් මගේ ව්‍යාපාරය අංග සම්පූර්ණ වීහ''.

විපුලසේන මහතා උපන් හා පදිංචි ගම බෝම්බුවල හෙයින් ඔහුගේ මෙම නව වෙළඳ ව්‍යාපාරයට '' බෝම්බුවල හැචරීස් '' යන නම යොදා ගන්නා ලදී.

ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් විපුලසේන මහතා හොරණ ගොවි පාසැලට ඇතුලු වීමට පෙරද කුකුළන් ඇතිකළ උද්යෝගිමත් තරුණයෙකි. ගොවි කටයුතුවලට ඔහු එදසිට තුබූ මෙම ලැදියාව නිසා ඔහුට පහසුව ගොවි පාසැලට ඇතුල්වීමට හැකිවූයේයයි අප සිතමු. එමෙන්ම ඔහු එදමෙන් අදද ගොවිකම් ව්‍යාප්ති නිලධාරීන් සමඟ ඉතා කිට්ටුව ආශ්‍රය කරන්නෙක් බව සඳහන් කළයුතුව තිබෙයි.

ගොවිකම් ව්‍යාප්ති නිලධාරීන්ගෙන් ඔහු ලබන උපදෙස් හා උපකාර අප හා සමඟ විස්තර කළේ මෙසේය : '' මාගේ මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමට මට සෑම අතින්ම උපකාර, උපදෙස් පමණක් නොව සෑම ධෛර්‍යයම දුන්නේ එවිට මෙම කොට්ඨාශය භාරව සිටි ගොවිකම් උපදේශක ජී. සමරනායක මහතාය. පළාතේ ආහාර නිෂ්පාදන ඕවර්සියර් මහතාද එසේම උපකාර විය. අද දවස පවා මෙම කොට්ඨාශය භාර ගොවිකම් ව්‍යාප්ත නිලධාරී නානායක්කාර මහතා ගෙන් ඊට නොදෙවැනි උපකාර මා ලබමි. මා වැනි අයෙකුට මෙම නිලධාරි මහතුන්ගේ නොමසුරු සහාය නොමැතිව මෙවැනි ව්‍යාපාරයක් සාර්ථක කළ නොහැකි බව මගේ හැඟීමයි. ''

විපුලසේන මහතාගේ කටයුතු හා උනන්දුව ඔහුගේම ව්‍යාපාරයට සීමාවී නැත. ඔහු බෝම්බුවල තරුණ ගොවි සමාජයේ ක්‍රියාකාරී සාමාජිකයෙක්ය. ගමේ කුකුළන් ඇතිකිරීමේ කටයුතු වැඩි දියුණු කිරීමට ඔහු බෙහෙවින් වෙහෙස දරයි.

මේ සඳහා බෝම්බුවල කුකුළන් ඇති කරනන්ගේ සමුපකාර සමිතියක් පිහිටු වීමට මූලික කටයුතු සියල්ල ඉටු කරන ලද්දේ විපුලසේන මහතා විසිනි. දැනට සාමාජිකයින් 18 කු සිටින මෙම සමිතියේ සභාපතිද මොහුමයි. විපුලසේන මහතාගේ මූලිකත්වය හේතුකොටගෙන බෝම්බුවල පෙදෙසෙහි වෙසෙන අයගේ, කුකුළු පාලනයට මෙතෙක් තුබූ භයසැක දුරුවී ගොස් තිබෙයි. ඔහුගේ මෙම උනන්දුව ඉතා ප්‍රශංසනීය බව ගොවිකම් ව්‍යාප්ති නිලධාරි නානායක්කාර මහතා අප සමඟ කීය.

විපුලසේන මහතාගේ ව්‍යාපාරයේ වැඩ කටයුතු සඳහා ඔහුට සහායවීමට සිටින්නේ තව එක් අයෙකු පමණය. ඒ අතර ඉදිරියට '' බෝම්බුවල හැචරීස් '' ව්‍යාපාරය තව තවත් දියුණු කිරීමට මේ තරුණයා සිතා ඇත. ගොවි කටයුතු සියල්ල ගැන ඉතාමත් උනන්දු මොහු, මෙය කුකුළන් ඇතිකිරීමේ දැ අලෙවියට පමණක් සීමා නොකර වෙනත් දේ විකිණීම සඳහා යොමු කරවීමටද කල්පනා කර තිබෙයි. බද්ධ හා වෙනත් පළතුරු පැළ, එළවළු ඇට, උඩවැඩියා, ඇන්තූරියම් වැනි ජනප්‍රිය මල් පැළැටි, මාළුවන්, හා '' ලව්බර්ඩ්ස් '' වැනි කුරුල්ලන්ද ඔහුගේ වෙළඳ ද්‍රව්‍යයන්ට කෙමෙන් අඩංගු කිරීමට ඔහු දැන් සිටම කටයුතු කරගෙන යන්නේය.

''උනන්දුවත්, ආශාවත්, ඇති උගත් තරුණයින්ට මෙවැනි ව්‍යාපාරයකට පා තබා වටිනා ලාභ ප්‍රයෝජන ලබා ගත හැක. එහෙත් ඔවුන් මෙවැනි කටයුතු වලදී බෙහෙවින් වෙහෙස මහන්සි විය යුතු බව මගේ අත්දැකීමය''යි පවසන මෙම උද්‍යෝගිමත් තරුණයාගෙන් අප දිවයිනේ අනෙක් තරුණයින්ට සාමාන්‍ය වශයෙන් හා ගොවි පාසැල් පුහුණුවක් ලත් අයට විශේෂ වශයෙන්ද ආදර්ශයක් ගත හැකි වේ.